**දිවුලපිටිය ප්‍රාදේශීය සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**
---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.977,751 ක් වූ පුස්තකාල පොත් දෙවරක් ගිණුම්ගත කිරීම නිසා පුස්තකාල පොත් ගිණුම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | 2020 අවසන් ගිනුමේ ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි. |
| (ආ) | සභාව සතු ඉඩම් 18 ක වටිනාකම තක්සේරුකර ප්‍රාග්ධනිතකර නොතිබුණි. | ඉඩම් තක්සේරු කර ප්‍රාග්ධනිත කළ යුතුවේ. | ඉඩම් වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව සතු ගොඩනැගිලිවල එකතු වටිනාකම රු.2,445,431 ක් හා සමාලෝචිත වර්ෂය තුල මිලදීගත් වටිනාකම රු.140,300 ක් වූ මුද්‍රණ යන්ත්‍රයක් ප්‍රාග්ධනිතකර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | 2020 අවසන් ගිනුමේ ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි. |
| (ඇ) | ගබඩා ණයහිමි ගිණුමේ ශේෂ ගැලපීමේදී රු.221,953 ක හර ශේෂයක් වැඩියෙන් සහ රු.251,942 ක බැර ශේෂයක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | 2020 අවසන් ගිණුමේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2004 සිට 2009 දක්වා බැංකුවට ඉදිරිපත් නොකල රු.142,336 ක චෙක්පත් විවිධ තැන්පත් ගිණුමේ දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | සොයා බලා විසඳා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |

1.3.2 **නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 14 ක ශේෂ එකතුව රු.104,660,892 ක් වුවද, උපලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.101,147,094 ක් වූයෙන් රු.3,513,798 ක වෙනසක් විය. | ලේඛන සහ උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |

1.3.3 **විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.99,987,399 ක් වූ ගිණුම් 05කට අදාලව ණයගැති, සේවක ණය, පොදු ගබඩා හා විදුලි ගබඩා ලේඛන සහ උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | පෙන්වා දී ඇති විගණන සාක්ෂි ගිණුම් සමග ඉදිරිපත් කළයුතු වේ. | 2020 අවසන් ගිණුමේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.4 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) 371 | වර්ෂ 03 ඉක්මවූ තත්කාර්ය අතුරු අග්‍රිම රු.6,623,255 ක් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කරගෙන යනු ලබන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ii) 571 | වර්ෂ 02 ඉක්මවූ රු.13,467,421 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරගෙන යනු ලබන බව දන්වා සිටිමි. |
| (ආ) ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අංක 1484 හා 2007 පෙබරවාරි 9 දිනැති ගැසට්පත්‍රය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර තිබුණද 2019 වර්ෂය වන විටත් වරිපනම් අයකරනුයේ නේවාසික දේපල 1124 කින් ව්‍යාපාරික දේපල 1701 කින් සහ වෙනත් දේපල 136 කින් පමණි. | ගැසට්පත්‍රය ප්‍රකාරව කටයුතු තළයුතු වේ. | නව තක්සේරුව ලබාදුන් පසු කටයුතු කරමි. |

1.5 **ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ**

(අ) **ලැබිය යුතු ශේෂ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට ඉන්ධන , කර්මාන්ත සහ වෙනත් අත්තිකාරම් ශේෂ පිළිවෙලින් රු.1,508,186 ක් රු.5,078,175 ක් හා රු.35,795 ක් විය. මෙම හිඟ ශේෂ තුල වසර 10 ට වැඩි පිළිවෙලින් රු.1,308,186 ක්, රු.3,066,753 , රු.7,018 ක් හා වසර 5-10 අතර පිළිවෙලින් රු.200,000 ක් රු.2,011,422 ක් සහ රු.28,777 ක් විය. | ලැබියයුතු ශේෂ අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | මෙම නොපියවූ ඉන්ධනඅත්තිකාරම්, කර්මාන්ත අත්තිකාරම් වෙනත් අත්තිකාම් 2006-2015 කාල සීමාවට අයත් බැවින් එවකට කටයුතු නොකරීමත් වර්තමානයේ ලිපි ලේඛන නොමැති වීමත් නිසා අත්තිකාරම් පියවා ගැනීමට නොහැකි වී ඇත. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය තුල වර්ෂ 2–3 ත් අතර රු.5,649,345ක් හා වර්ෂ 01ට අඩු රු.42,772,256 ක් විය. | ලැබියයුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | අදාල නිලධාරීන්ට දන්වා ඇත. ඒ අනුව කටයුතු කරගෙන යනු ලබන බව දන්වා සිටිමි. |

(ආ) **ගෙවිය යුතු ශේෂ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය තුල වර්ෂ 3-5 අතර රු.10,177,987 ක් , වර්ෂ 2-3 ත් අතර රු.5,042,855 ක් හා වර්ෂ 01 ට අඩු රු.24,791,417 ක් විය. | ගෙවියයුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | අදාල නිලධාරීන්ට දන්වා ඇත. ඒ අනුව කටයුතු කරගෙන යනු ලබන බව දන්වා සිටිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවියයුතු තැන්පත් ශේෂය තුල වර්ෂ 01 ට අඩු රු.1,637,145 ක් ද, වර්ෂ 02-05 අතර රු.7,467,280 ක් හා වර්ෂ 05 ට වැඩි රු.4,483,613 ක් විය. | ගෙවියයුතු තැන්පත් ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | අදාල නිලධාරීන්ට දන්වා ඇත. ඒ අනුව කටයුතු කරගෙන යනු ලබන බව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,962,179 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.40,618,153 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.121,102 ක් වූ අගරු චෙක්පත් හඳුනාගෙන නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | මේ පිළිබඳව පලාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇත. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | 2018 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,407,778 | 14,690,393 | 13,592,787 | 1,188,492 | 10,150,985 | 10,521,241 | 10,439,903 | 81,338 |
| කුලී | 7,294,154 | 7,723,357 | 7,504,106 | 582,351 | 6,676,303 | 6,967,641 | 6,954,734 | 12,906 |
| බලපත්‍ර ගාස්තු | 1,827,148 | 1,896,150 | 1,896,150 | - | 1,564,544 | 1,925,064 | 1,925,064 | - |
| වෙනත් ආදායම් | 79,853,430 | 81,783,723 | 81,779,487 | - | 58,813,707 | 65,529,022 | 65,529,022 | - |
| | 98,382,510 | 106,093,623 | 104,772,530 | 1,770,843 | 77,205,539 | 84,942,968 | 84,848,723 | 94,244 |

### 2.3.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට පැවති වරිපනම් හිඟ ශේෂය තුල වර්ෂ 10 ට වැඩි රු.22,990 ක් , වර්ෂ 5-10 ත් අතර රු.21,800 ක්, වර්ෂ 3-5 අතර රු.19,228 ක්, වර්ෂ 2-3 අතර රු.34,714 ක් හා වර්ෂ 01 ට අඩු රු.1,076,179 ක් විය. | හිඟ වරිපනම් අයකරගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගතයුතු වේ. | වරිපනම් හිඟ අය කර ගැනීමට කටයුතු කරගෙන යනු ලබන බව දන්වා සිටිමි. |
| (ආ) | දේපල සමීක්ෂණය අනුව සභා මුළු දේපල සංඛ්‍යාව 57,822 ක් ලෙස හඳුනාගෙන තිබුණද දේපල 2961 කින් පමණක් වරිපනම් අයකර තිබුණි. | නව බදු තක්සේරුව ලබාගැනීමට කටයුතු කළයුතු වේ. | තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දී තිබුණද නිලධාරීන් හිඟය නිසා නව තක්සේරු ලබා දී නොමැත. |
| (ඇ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරු ආඥාපනත ප්‍රකාරව වරිපනම් බදු වර්ෂ 05 කට වරක් තක්සේරු කළයුතු වුවද දිවුලපිටිය හා කොටදෙනියාව උප කාර්යාල 1994 දී හා කෙහෙල්ඇල්ල උප කාර්යාලය 2010 දී අවසන් වරට වරිපනම් තක්සේරුව සිදුකර තිබුණි. | නව බදු තක්සේරුව ලබාගැනීමට කටයුතු කළයුතු වේ. | නව තක්සේරුව ලබා දී නොමැත. |

2.3.3 **කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කෙහෙල්ඇල්ල උප කාර්යාලයේ වර්ෂ 10 යට වඩා පැරණි බදු කුලී හිඟය රු.327,098 ක් විය. | හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මේ පිළිබඳ පලාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇත. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුන කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකලයුතු වටිනාකම රු.11,035,000 ක් වූ ව්‍යාපෘති 05 ක් ඉටුකර නොතිබුණි. | අවශ්‍යතාවය පරිදි ප්‍රතිපාදන සලසා ගත යුතුය. | මුදල් ප්‍රමාණවත් නොවීම නිසා ක්‍රියාත්මක කර නැත. |

(ආ) **අත්හැර දැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ (නර්ඩ්) උපදේශකත්වයෙන් 2014 වර්ෂයේ රු.500,000 ක් වැයකර ජීව වායු ඒකකයක් සභා පරිශ්‍රය තුල සකස්කර , එය ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ සේවකයෙකු රු.6,000 ක ගාස්තු ගෙවා නර්ඩ් ආයතනය මගින් පුහුණුකරවා තිබුණි. එහෙත් ජීව වායු ඒකකයට අවශ්‍ය නල එලීම සඳහා සුදුසු ස්ථානයක් ලබානොදීම නිසා නර්ඩ් ආයතනයේ ව්‍යාපෘති ලැයිස්තු වලින් ඉවත්කර තිබුණු අතර 2020 මැයි 11 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන ජීව වායු ඒකකය අත්හැරදමා තිබුණි. | අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට කටයුතු කළයුතු වේ. | මේ පිළිබඳව කටයුතු කරගෙන යනු ලබන බව දන්වා සිටිමි. |

(ඇ) **මහජන පැමිණිලි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ මහජන පැමිණිලි 174 කින් පැමිණිලි 56 ක් පමණක් විසඳා තිබුණි. | පැමිණිලි විසඳීම සඳහා කඩිනම් පියවර ගත යුතුවේ. | ඉදිරියේදී පැමිණිලි විසඳීමට කටයුතු කරමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

(අ) **සේවක පුරප්පාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනුමත කාර්යමණ්ඩලය තුල පුස්තකාලාධිපති තනතුරු 04 ක්, ආදායම් පරීක්ෂක 03 ක්, පුස්තකාල සහායක තනතුරක් වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 04 ක්, සෞඛ්‍ය කම්කරු තනතුරු 02 ක් හා බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවාගැනීමට කටයුතු කළයුතු වේ. | පුස්තකාලාධිපති පුරප්පාඩු පුරවා දෙන ලෙස පලාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇත. |

(ආ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවක ණය ශේෂය තුල පැවති මියගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් රු.21,508,178 ක් හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 09 දෙනෙකුගෙන් රු.271,633 ක් වසර කිහිපයක සිට අය නොවී පැවතුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | අය කරගත නොහැකි ණය ශේෂ පිළිබඳව පලාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇත. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ප්‍රමාදවී ගෙවීම නිසා රු.163,876 ක් වූ අධිභාර ගෙවා තිබූ නමුත් ඉන් රු.158,784 ක මුදලක් වගකිවයුතු අයගෙන් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | වගකිවයුතු පාර්ශවයන් හදුනාගෙන අදාල අධිභාර අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | අදාල නිලධාරීන්ට දන්වා ඇත. ඒ අනුව කටයුතු කරගෙන යනු ලබන බව දන්වා සිටිමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | | |
|---|---|---|
| 2019 වර්ෂයේදී විදුලි අංශයේ රාජකාරි සඳහා ඩිමෝ බට්ටා රථ 03 ක් පෞද්ගලික ආයතනයකින් කුලී පදනම මත ලබාගෙන රු.2,488,200 ක් ගෙවා තිබුණි. එම වාහන සඳහා ගෙවීම් කිරීමේදී බලප්‍රදේශය තුල අලුත්වැඩියා කල වීථි පහන් පිළිබඳ විස්තර සලකා බැලීමකින් තොරව, ගමන්ගත් මාර්ග පිළිබඳ විස්තර පමණක් පරීක්ෂාකර බලා ගෙවීම් සිදුකර තිබුණි. | වාහන සඳහා ගෙවීම් කිරීමේදී ගමන්ගත් මාර්ග පමණක් නොව ඉටුකළ වැඩ පිළිබඳව සැලකිය යුතු වේ. | වාහන සඳහා ගෙවීම් කිරීමේදී අලුත්වැඩියා කළ වීථි පහන් පිළිබඳ විස්තර ගොනු කර තබනු ලබන බව දන්වමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන අමාත්‍යාංශ මගින් ලද 06 ක් හා බස්නාහිර පළාත් සභාවෙන් ලද වාහනයක්ද ඇතුළුව රු.44,044173 ක් වටිනා වාහන 07 ක් සභාවට පවරාගෙන නොතිබුණි. | සභාවට ලද වාහන පවරාගැනීමට කටයුතු කළයුතු වේ. | පවරාගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. |

3.5.2 **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ රු.581,697 ක් වැයකර කොටදෙනියාව දෙල්ගොල්ල එස්ටේට්හි ප්‍රජා ශාලාවක් ඉදිකර තිබූ නමුත් මෙම ප්‍රජා ශාලාව කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අතහැර දමා තිබුණි. | ප්‍රජා ශාලාව ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමට කටයුතු කළයුතු වේ. . | ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරමි. |

3.5.3 **තොග ඌනතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොදු ගබඩා තොගයෙහි රු.22,021,294 ක හා විදුලි ගබඩා තොගයෙහි රු.2,405,285 ක හඳුනා නොගත් තොග ඌනතාවයක් පැවතුණි. | අදාල ලිපි ලේඛන අනුව ඌනතාවය හඳුනාගැනීමට කඩිනමින් පියවර ගත යුතු වේ. | 2012 වර්ෂයට පෙර සිට පැවත එන දෝෂයක් වන අතර මේ වන විට ලිපි ලේඛන නොමැති බැවින් ද කටයුතු කරගෙන යනු ලබන බව දන්වමි. |

3.6 **කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඳුරාගාර ග්‍රාම නිලධාරි වසමේ දූනගහ ගොඩිගමුව චාර්ලිස් පටුමග (මෝල පාර) ශාන්ත මහතාගේ කඩය අසලට වැටෙන පාර කොන්ක්‍රීට් කිරීමේ ගෙවීම් වාර්තාවට අනුව මීටර් 18.78 ක් සඳහා රු.191,959 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | ගෙවීම් කිරීමේදී නිවැරදිතාවය තහවුරු කරගැනීමෙන් පසු ගෙවීම් කළයුතු වේ. | වැඩ අධිකාරී වාර්තාව අනුව ගෙවා ඇත. |